**ඩී.එස්. සේනානායක විද්‍යාලය, කොළඹ 07.**
**D.S. Senanayake College, Colombo 07.**

තුන්වන වාර ඇගයීම -2016
Third Term Test - 2016
12 ශ්‍රේණිය -
Grade 12

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I පත්‍රය**
**Mass Communition & Media Studies - Paper I**

පැය තුනයි.
Three hours

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

(01) ආකේතිකරණය යනු,
(1) සංඥා, සංකේත ආදිය ඇසුරින් නැවත පණිවිඩයක් සකස් වීම යි.
(2) කිසියම් අදහසක් සංඥා සංකේත බවට පත් කිරීම යි.
(3) කිසියම් සංදේශයක් සම්ප්‍රේෂණය කරන්නා යි.
(4) කිසියම් සංදේශයක් ප්‍රතිග්‍රහනය කරන්නා යි.
(5) කිසියම් පණිවිඩයක් අර්ථකථනය කරන්නා යි.

(02) සන්නිවේදනය හඳුනා ගැනීම සඳහා විවිධ සංකල්ප ඇත. මේ අතරින් පොදු සුබසිද්ධිය අරමුණු කරගනිමින් සන්නිවේදන හා මාධ්‍ය නිදහසේ වගකීම රජය විසින් පාලනය කළ යුතු බව පෙන්වා දෙන්නේ,
(1) ප්‍රජාතන්ත්‍රීකරණ සන්නිවේදන සංකල්පය යි.
(2) සමාජ වගකීම් පිළිබඳ සන්නිවේදන සංකල්පය යි.
(3) සෝවියට් සමාජවාදී සන්නිවේදන සංකල්පය යි.
(4) අධිපතිවාදී සන්නිවේදන සංකල්පය යි.
(4) නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පය යි.

The National E-Learning Portal for The General Education

(03) ඩේවිඩ් කේ. බාර්ලෝ ඉදිරිපත් කළ නාලිය පිළිබඳ අදහස් නිරූපණයට අදාළ නොවන්නේ,
(1) ශ්‍රවණය යි. (2) ආඝ්‍රාණය යි.
(3) දැකීම යි. (4) රස දැනීම යි.
(5) නියෝජනය යි.

(04) සන්නිවේදන බාධක පිළිබඳව වඩාත් පැහැදිලිව දක්වන ආකෘතිය වන්නේ,
(1) ෂැනොන් හා වීවර් ආකෘතිය යි. (2) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතිය යි.
(3) ඩේවිඩ් කේ. බර්ලෝ ආකෘතිය යි. (4) විල්බර් ශ්‍රාම් ආකෘතිය යි.
(5) ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතිය යි.

(05) තොරතුරු දැන ගැනීම, දුක සැප බෙදා ගැනීම, මග පෙන්වීම, චෝදනා කිරීම ආදිය කාර්යයන් ඉටු කරගත හැක්කේ,
(1) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයෙනි. (2) අන්තර්පුද්ගල සන්නිවේදනයෙනි.
(3) සමූහ සන්නිවේදනයෙනි. (4) ජන සන්නිවේදනයෙනි.
(4) අවාචික සන්නිවේදනයෙනි.

(06) රියදුරු පුහුණු ආයතනයක පුහුණුකරුවෙක් මාර්ග සංඥා පිළිබඳ පෝස්ටර් ප්‍රදර්ශනය කරමින් ඒවා හඳුනා ගන්නා ලෙස පැමිණි පුහුණුවන සිසුන් පිරිසකට පවසයි. මෙහි ඇතුළත් සන්නිවේදන ස්වරූපය හා වර්ගය වන්නේ,
(1) දෘශ්‍ය සන්නිවේදනය හා සමූහ සන්නිවේදය යි.
(2) වාචික සන්නිවේදනය හා දෘශ්‍ය සන්නිවේදනය යි.

(3) දෘශ්‍ය සන්නිවේදන හා පුද්ගලාන්තර සන්නිවේදනය යි.
(4) පුද්ගලාන්තර සන්නිවේදනය හා වාචික සන්නිවේදනය යි.
(5) ශ්‍රව්‍ය සන්නිවේදනය හා සමූහ සන්නිවේදනය යි.

(07) කිසියම් සන්නිවේදන ස්වරූපයක ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.
A- මිනිසාගේ සැකය, කුතුහලය, ප්‍රයෝජනය ගනිමින් ක්‍රියාත්මක වේ.
B- තොරතුරු ගලා යාම ඉතා වේගවත්ව සිදුවේ.
C- සැඟවුනු තොරතුරු පවා ලැබීමේ හැකියාවක් තිබේ.
ඉහත ලක්ෂණ සහිත සන්නිවේදන ස්වරූපය වන්නේ,
(1) වාචික සන්නිවේදනය (2) අවාචික සන්නිවේදනය
(3) අවිධිමත් සන්නිවේදනය (4) දෘශ්‍ය සන්නිවේදනය
(5) ලිඛිත සන්නිවේදනය

(08) සමාජ විකාශය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
(1) අද්‍යතන සමාජය ඓතිහාසික සමාජයේ ක්‍රමික හා අක්‍රමික විකාශය කි.
(2) ප්‍රාථමික, වහල්, වැඩවසම්, ධනවාදී හා සමාජවාදී යනු සමාජයේ අක්‍රමික විකාශන අදියරන් ය.
(3) සමාජයේ විකාශනය තාක්ෂණික සංවර්ධනයක් සමග සිඝ්‍ර වීමට පටන් ගැනුණි.
(4) සමාජ විකාශනයේ සමග මිනිස් අවශ්‍යතා අසීමිත බවට පත්විය.
(5) සන්නිවේදනයේ දියුණුව සමාජ විකාශනයට ප්‍රබලව හේතුවූ සාධකයෙකි.

(09) ජනමාධ්‍ය මගින් සිදුවන සන්නිවේදනයේ දී අනිවාර්යය සාධකයක් නොවන්නේ,
(1) දොරටුපාල් කාර්යය යි. (2) තාක්ෂණික විධි ක්‍රම භාවිතය යි.
(3) ද්වි මාර්ගික බවින් යුතු වීම යි. (4) පොදු සංදේශ විසරණය යි.
(5) ධුරාවලියක් සහිත ආයතනික රටාව යි.

(10) අර්ථ බාධක වලට තුඩු දිය හැකි ප්‍රධාන සාධකයක් වීමට වඩාත්ම ඉඩ ඇත්තේ මින් කවර ගැටළුවක් ද?
(1) පණිවිඩ සම්ප්‍රේෂණය (2) නාලිකාව තිරණය කිරීම.
(3) සංකේත තෝරා ගැනීම. (4) තාක්ෂණික විෂමතා
(5) ග්‍රාහක දුර්වලතා

(11) A- ජාතික රාජ්‍යයන් දුර්වල වීමේ ප්‍රතිඵලයකි.
B- ගතික ක්‍රියාවලියකි.
C- ද්‍රව්‍යමය ආර්ථිකය ඉක්මවා මූල්‍යමය ආර්ථිකය ශක්තිමත් වේ.
D- විවිධ ජනමාධ්‍ය ඒකීය පද්ධති බවට පත් වේ.
ඉහත ලක්ෂණ අදාළ වන්නේ,
(1) ගෝලීයකරණය යි. (2) නව ලිබරල්වාදීයට යි.
(3) මාධ්‍ය සංස්කෘතියට යි. (4) පුරවැසි මාධ්‍යවේදයට යි.
(5) ඥාන ගවේෂණයට යි.

(12) පුරවැසි මාධ්‍ය වාර්තාකරුවෙකු පිළිබඳව කියවෙන පහත ප්‍රකාශ අතුරින් සාවද්‍ය කරුණ තෝරන්න.
(1) පුරවැසි මාධ්‍යකරුවා පුහුණු මාධ්‍යකරුවෙක් නොවේ.
(2) වෘත්තීය තාක්ෂණික උපකරණ භාවිතා නොකරයි.
(3) සමාජයේ දැවෙන, සමාජ, ආර්ථික, දේශපාලනික ගැටළු පිළිබඳ තොරතුරු වාර්තාකරණයට උනන්දු වෙයි.
(4) කිසියම් එක් මාධ්‍යයකට පමණක් සුවිශේෂී වී තොරතුරු වාර්තා කරයි.
(5) පුරවැසි දෘෂ්ටිකෝණයෙන් තොරතුරු වාර්තා කිරීම සිදුවේ.

(13) මොළයේ වම් පසින් කෙරෙන කාර්යයක් හා දකුණු පසින් කෙරෙන කාර්යයක් දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

(1) සංගීතමය හැකියා - බුද්ධිමය විශ්ලේෂණ
(2) ආවේදන - නිර්මාණශීලී බව
(3) ගණිතමය හැකියා - සංගීතමය හැකියා
(4) නර්තනය - විචාරය
(5) කථනය - නර්තනය

(14) කෙටි කාලීන මතකයක් දිගු කාලීන මතකයක් බවට පත්වීමට බලනොපාන්නේ,

(1) ආවර්ජනය (2) පුහුණුව (3) පුනරීක්ෂණය (4) අභ්‍යාසය (5) භාවිතය

(15) ස්ව සංකල්පය පෝෂණයෙන් පුද්ගලයෙකුට අත්වන වාසියක් වන්නේ,

(1) තමා කවුරුන්දැයි මැනවින් හඳුනා ගත හැකි වේ.
(2) තමාගේ චරිත්‍රය තුළ සංවර්ධනය විය යුතු තැන් සංවර්ධනය කරගත හැකිය.
(3) සමාජය තුළ යහපත් ප්‍රතිරූපයක් ගොඩනඟා ගැනීමට ඉවහල් වේ.
(4) පුද්ගල පෞරුෂය ඉහළ නංවා ගැනීමට හැකිවේ.
(5) ඉහත සියල්ලම ය.

(16) සන්නිවේදන නිපුණතා කිහිපයක් පහත දැක්වේ.

A- එලදායී කථනය B- වගකීම හා වගවීම C- සහවේදනය
D- විසම්මුතිය හා එකඟත්වය E- ශ්‍රවණ නිපුණතා සංවර්ධනය

ඉහත ඒවා අතුරින් පුද්ගලාන්තර සන්නිවේදන නිපුණතා අතරට අයත් වන්නේ,

(1) A, B, C (2) B, C, E (3) A, D,E (4) A, C, E (5) B, D, E

(17) ශ්‍රවණය සම්බන්ධව ඇති සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) අවධානයෙන්, තොරතුරු ග්‍රහනය කර ගැනීම ශ්‍රවණය යි.
(2) යහපත් අන්තර් පුද්ගල සබඳතා සඳහා ශ්‍රවණය ඉවහල් වේ.
(3) විවිධ මානසික චිත්තවේග ශ්‍රවණය කෙරෙහි හිතකර ලෙස බලපායි.
(4) චිත්තවේග පාලනයෙන් ශ්‍රවණය උසස් මට්ටමකට ගෙන යා හැකිය.
(5) සංජානනය දුර්වල වීම නිසා ශ්‍රවණය දුර්වල විය හැකිය

(18) A- අහසේ වැහි වළාවක් තිබීම.
B- ශ්‍රීලාංකික ධජය විදේශයකදී ප්‍රදර්ශනය කිරීම යි.
C- රථවාහන පාලනය සඳහා වර්ණ යොදා ගැනීම යි.

මේවායේ අනුපිළිවෙල වන්නේ,

(1) ස්වභාවික සංඥා, සන්නිවේදන සංඥා, ජනමාධ්‍ය සංඥා
(2) මුද්‍රා සංඥා, සන්නිවේදන සංඥා, ස්වභාවික සංඥා
(3) ස්වභාවික සංඥා, ජාතික සංඥා, සන්නිවේදන සංඥා
(4) මුද්‍රා සංඥා, ස්වභාවික සංඥා, ජනමාධ්‍ය සංඥා
(5) ස්වභාවික සංඥා, ජනමාධ්‍ය සංඥා, සන්නිවේදන සංඥා

(19) සමූහයක් හඳුනා ගැනීමේ දැකිය හැකි සාමූහික ගුණාංග අතරට අයත් නොවන්නේ,

(1) අරමුණු (2) වගකීම හා වගවීම
(3) සන්නිවේදන මාර්ග (4) නායකත්වය හා අනුගාමිකත්වය
(5) ප්‍රතිමාන හා නියමයන් ය.

(20) දරුවන්ගේ සමාජනුයෝජන ක්‍රියාවලිය ආරම්භ වන්නේ,

(1) පවුල තුළිනි.
(2) පාසල තුළිනි.
(3) ජනමාධ්‍ය තුළිනි.
(4) සමවයස් කණ්ඩායම් තුළිනි.
(5) ආගමික සංස්ථා මගිනි.

(21) A- සුමේරියන් භාෂාව B- හින්දි භාෂාව C- සංස්කෘත භාෂාව D- කමත් භාෂාව

ඉහත භාෂා ප්‍රභේද නම් කළ හැකි නිවැරදි අනුපිළිවෙල වන්නේ,

(1) ජීව භාෂාව, විදේශ භාෂාව, මළ භාෂාව, උප භාෂා
(2) උප භාෂා, මළ භාෂා, ජීව භාෂා, සම්මත භාෂා
(3) මළ භාෂා, ජීව භාෂා, සම්භාව්‍ය භාෂා, උප භාෂා
(4) මළ භාෂා, ජීව භාෂා, උප භාෂා, විදෙස් භාෂා
(5) අසම්මත භාෂා, උප භාෂා, සම්භාව්‍ය භාෂා, උප භාෂා

(22) "රණ මොනරා - රන මොනරිය හා
රඟ දෙන ප්‍රේම වසන්තය මේ......"
ඉහත ගීත ඛණ්ඩයෙහි "මොනරිය" යනුවෙන් යෙදීම.

(1) භාෂාව අවභාවිතයෙන් යෙදීම කි.
(2) අසම්භාව්‍ය සන්නිවේදනය කි.
(3) මොනරාගේ ගැහැණු නිසි විදියට හඳුන්වා දීම කි.
(4) භාෂාවේ අසම්මතය නිර්මාණාත්මකව යොදා ගැනීම කි.
(5) ගී පද රචකයාට වැරදීමකින් සඳහන් වීම කි.

(23) භාෂාවක් යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) සංකේත සමුදායකි.
(2) ශබ්ද වල සංක්ෂේපිතය කි.
(3) රූප හා ශබ්ද රටා සමුදාය කි.
(4) අක්ෂර මාලාව කි.
(5) උත්පත්තියෙන් රැගෙන එන ලද දායාදය කි.

(24) ගුවන් විදුලිය තුළ භාෂාව හසුරුවන නිවේදකයෙකු වඩාත් අවධානය යොමු කළ යුත්තේ,

(1) කෙටි වේලාවක් තුළ අදහස් රැසක් ප්‍රකාශ කළ හැකි වේගවත් බසක් කෙරෙහි ය.
(2) සම්මත ව්‍යාකරණ අනුව භාවිතා වන ගාම්භීර බසක් කෙරෙහි ය.
(3) ඉංග්‍රිසි, සිංහල භාෂා මිශ්‍රිත නව ආරක කතා ශෛලිය කි.
(4) කතා කරන භාෂාවට ඉතා සමීප ස්වභාවික සජීවී බස කි.
(5) ග්‍රාමීය ජනතාවගේ ආකර්ශණය දිනාගත හැකි සරල සජීවී බසක් කෙරෙහි ය.

(25) සක්‍රිය සවන් දීම වඩාත්ම වැදගත් වෘත්තිකයා වන්නේ,

(1) මහජන සම්බන්ධතා නිලධාරියා
(2) මානසික උපදේශකවරයා
(3) ප්‍රාථමික පන්ති ගුරුවරයා
(4) රූපවාහිනී සාකච්ඡා මෙහෙය වන නිවේදකයා
(5) ප්‍රජා සම්බන්ධීකරණ නිලධාරියා

(26) ලොව ඇති සියලුම භාෂාවන් තුළ පොදු ව්‍යාකරණ සමුදායක් දක්නට ලැබෙන්නේ,

(1) විවිධ ජන කණ්ඩායම් අතර අතීතයේ සිට පැවති අන්තර් සම්බන්ධතා නිසා ය.
(2) පරිසරයේ ඇති වස්තූන් සමාන ලෙස සංජානනය කිරීමට සියලුම ජාතීන් සමත් වන නිසා ය.
(3) භාෂා ව්‍යවහාරයට අනුබල දෙන පොදු නියුරෝන සම්බන්ධතාවක් මිනිස් මොළය තුළ වර්ධනය වී ඇති නිසා ය.
(4) නිර්මාණවාදී මතයට අනුව දෙවියන් වහන්සේ සියලු මානවයාට සමාන ලෙස භාෂා හැකියාව තිළිණ කර ඇති නිසා ය.
(5) ආක්‍රමණවලට ලක්වීම නිසා බල රහිත ජාතීන්ගේ භාෂාවන් බලපෑමට ලක්වී ඇති නිසා ය.

(27) සංකේතාක්ෂර සහිත භාෂා භෝඩියක් දක්වන කාණ්ඩය වන්නේ,

(1) චීන, ජපන් සහ කොරියන් අක්ෂරය
(2) ජපන්, මැන්ඩරින් සහ මරාති අක්ෂරය
(3) මලයාලම්, කර්ණාටක සහ චීන අක්ෂරය
(4) ජපන්, චීන හා බෙංගාලි අක්ෂරය
(5) බෙංගාලි, චීන සහ නගාලෝ අක්ෂරය

(28) මහජන සම්බන්ධතා කාර්යයේ දී මහජනයා යන්නට ඇතුළත් නොවන්නේ,

(1) ආයතනයේ පාර්ශවකරුවන්
(2) ආයතනයේ කොටස් හිමිකරුවන්
(3) ආයතනයේ සේවා හා භාණ්ඩ සපයන්නන්
(4) ආයතනයේ සේවා ලබන සියලුම පාර්ශව
(5) ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය හා හිමිකරුවන්

(29) අධ්‍යාපනික ප්‍රදර්ශනය මහජන සම්බන්ධතා මාධ්‍යයක් ලෙස වැදගත් වන්නේ,

A- ඒ තුළින් ආයතනය පිළිබඳ සැලකිය යුතු ප්‍රචාරයක් ලැබෙන නිසා ය.
B- ආයතනය හා ජනතාව මුණගැසෙන ස්ථානයක් වන නිසා ය.
C- ජනතාවගේ ප්‍රතිපෝෂණීය අදහස් ලබා ගැනීමට ඉඩකඩ සැලසෙන නිසා ය.
D- ජනතාවට අවශ්‍ය මග පෙන්වීම සෘජුවම සිදුකළ හැකි නිසා ය.
E- ආයතනයේ නිෂ්පාදන අලෙවි කිරීමෙන් අලෙවි ප්‍රවර්ධනයට ඉඩ සැලසෙන නිසා ය.

ඉහත ප්‍රකාශ අතරින්,

(1) A, B, C ප්‍රකාශ සත්‍ය වේ.
(2) B, C, D සත්‍ය වන අතර E අසත්‍ය වේ.
(3) A හැර සියලු ප්‍රකාශ සත්‍ය වේ.
(4) A, B, C, D සත්‍ය වන අතර E අසත්‍ය වේ.
(5) A, B, C, D, E සියල්ල සත්‍ය වේ.

(30) ජනමාධ්‍ය හා මනා සබන්ධතාවක් පවත්වාගෙන යාමට නම්, මහජන සම්බන්ධතා නිළධාරියා සතු විය යුතු වැදගත්ම සුදුසුකම නම්,

(1) ජනමාධ්‍ය වල භාවිත තාක්ෂණය පිළිබඳ අවබෝධය යි.
(2) ජනමාධ්‍යවේදියෙකු ලෙස ලබා තිබෙන පරිචය යි.
(3) මාධ්‍ය සාකච්ඡාවක් සංවිධානයට හා මෙහෙය වීමට ඇති හැකියාව යි.
(4) මාධ්‍ය ආයතන හා සම්බන්ධතා පවත්වා ගැනීමේ හැකියාව යි.
(5) මාධ්‍ය නිවේදනයෙක් සකස් කිරීමට ඇති හැකියාව යි.

(31) පහත සඳහන් ආයතන අතුරින් රජය හා මහජනතාව අතර මහජන සම්බන්ධතාව ගොඩනැංවීම සඳහා කටයුතු කරන ආයතනය නොවන්නේ,

(1) රාජ්‍ය තොරතුරු කේන්ද්‍ර
(2) 119 හා 118
(3) ජනාධිපති මාධ්‍ය අංශය
(4) ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
(5) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය යි.

(32) මහජන සම්බන්ධතා මෙවලමක් ලෙස සැලකිය නොහැකි වන්නේ,

(1) මුද්‍රිත මාධ්‍යය යි.
(2) ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යය යි.
(3) පාරිසරික මෙවලම යි.
(4) ප්‍රදර්ශනය යි.
(5) මාධ්‍ය සම්බන්ධතාවය යි.

(33) අප පාසලේ නිරන්තරයෙන් ගනු ලබන ඡායාරූප යොදාගනු ලැබුවේ පහත සඳහන් අවශ්‍යතා සඳහා ය.

A- පාසල් කාර්යාලය අසල දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීමට ය.

B- පුවත්පත් වල පළකිරීම සඳහා මාධ්‍ය ආයතන වෙත ලබා දීමට ය.

C- පාසලට එන අමුත්තන්ට නැරඹීමට යි.

D- විද්‍යාලයීය සියපත සඟරාවෙහි පළ කිරීමට යි.

ඉහත අවශ්‍යතා අතුරින් මහජන සම්බන්ධතාවට අදාළ කාර්යයන් වන්නේ,

(1) A හා B ය. (2) A, B, C ය. (3) B හා D ය.

(4) C, B, D ය. (5) A, B, C, D සියල්ලම ය.

(34) මහජන සම්බන්ධතා විධික්‍රමයක් ලෙස අනුග්‍රාහකත්වය දැක්වීම සම්බන්ධයෙන් කරුණු කිහිපයක් පහත දැක්වේ.

A- සංවිධානයක් හෝ ආයතනයක කීර්ති නාමය වැඩි දියුණු කර ගැනීමට අනුග්‍රාහකත්වය දැක්වීම මගින් සිදුවේ.

B- අනුග්‍රාහකත්වය සැලසීම එකඟ වූ කොන්දේසි මත සිදුවේ.

C- සාමාන්‍යයෙන් අනුග්‍රාහකත්වය ලැබෙන්නේ කෙටි කාලීන ව්‍යාපෘති සඳහා පමණි.

D- අනුග්‍රාහකත්වය මගින් ලැබෙන මහජන ප්‍රසාදයට වඩා වෙළඳ දැන්වීමකින් ලැබෙන මහජන ප්‍රසාදය වැඩි ය.

ඉහත කරුණු අතරින්,

(1) A, B සත්‍ය වන අතර C, D අසත්‍ය වේ.

(2) B, C සත්‍ය වන අතර A, D අසත්‍ය වේ.

(3) A, B, C සත්‍ය වන අතර D අසත්‍ය වේ.

(4) A, C සත්‍ය වන අතර B, D අසත්‍ය වේ.

(5) A, B, C, D සියල්ලම සත්‍ය වේ.

(35) මහජන සම්බන්ධතා සැලැස්මක් පෙර ඇගයීමට ලක් කිරීම මගින් සිදුකරන්නේ,

(1) සැලැස්මේ අඩුපාඩු සොයා බලා ඒවා සැකසීම යි.

(2) සැලැස්මේ අරමුණුවල යෝග්‍යතාව පරීක්ෂා කිරීම යි.

(3) සැලැස්ම අරමුණු ඉටුකර ගැනීමට ගැළපෙන, අයවැය ඇස්තමේන්තුවට ගැළපෙන, ක්‍රියාත්මක කළ හැකි එකක් දැයි අවසාන වශයෙන් තක්සේරු කිරීම යි.

(4) සැලැස්මේ අයවැය ඇස්තමේන්තුව අවසාන වශයෙන් තක්සේරුවට ලක් කිරීම යි.

(5) සැලැස්මේ උපාය මාර්ග නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට අදාළ නිර්ණායක තිබේදැයි තක්සේරු කිරීමට යි.

(36) සමාජයීය සහජීවනය සඳහා වඩාත් අනුබල දෙන සංස්කෘතික ප්‍රවණතාව වන්නේ,

(1) සංස්කෘතික විසරණය යි. (2) සංස්කෘතික සංසරණය යි.

(3) සංස්කෘතික ඒකාකෘතිකරණය යි. (4) සංස්කෘතික කම්පනය යි.

(5) සංස්කෘතික හුවමාරුව යි.

(37) සංස්කෘතිය යනු සමාජය විසින් ඉගෙන, එක්රැස් කරගන්නා වූත්, බෙදා හදාගෙන පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යනු ලැබූ අදහස් උදහස් සහ පුරුදුය. ඉහත නිර්වචන ඉදිරිපත් කරන ලද්දේ,

(1) මාග්‍රට් මීඩ් ය. (2) රැල්ෆ් ලින්ටන් ය.

(3) මැලිනොවුස්කි ය. (4) සී. චාර්ල්ස් කූලි ය.

(5) විල්බර් ශ්‍රාම් ය.



The National e-learning Portal for The General Education

(38) වර්තමානයේ නව රැල්ලේ ගීත රචනා පිළිබඳව ඇතැමුන් පවසන්නේ, "පුවත්පත් තිරු ලිපියකට වුනත් නැගලා යන තනුවක් දාගත්තම සිංදුවක් තමයි" යනුවෙනි මෙවැනි ප්‍රකාශයකින් ගම්‍ය වන්නේ,

(1) සංස්කෘතික විසරණය යි. (2) සංස්කෘතික ආක්‍රමණය යි.
(3) සංස්කෘතික කම්පනය යි. (4) සංස්කෘතික ලැග්ම යි.
(5) විරෝධී සංස්කෘතිය යි.

(39) යම් සමාජයක් සාම්ප්‍රදායික ජන සංස්කෘතියේ සාධක ඉතා බලවත්ව පවතින විට මාධ්‍ය සංස්කෘතියේ හැසිරීම,

(1) ඉතා දුර්වල වේ. (2) වඩා බලවත් වේ.
(3) සම්ප්‍රදායයන් සමග එක්ව කටයුතු කරයි. (4) වගකීමෙන් තොරව කටයුතු කරයි.
(5) දැඩි බලපෑමක් ජන සංස්කෘතියට එල්ල කරයි.

(40) මාධ්‍ය සංස්කෘතිය යනු,

(1) විවිධ ජනමාධ්‍යයන් අතර තිබෙන සංස්කෘතිය යි.
(2) විවිධ සමාජයීය සමූහයන්ගේ ව්‍යුහය ලක්ෂණ යි.
(3) සංකීර්ණ සමාජ පරිසරය තුළ සමාජයට වඩාත් පොදු වූ තොරතුරු හුවමාරු ක්‍රමය යි.
(4) ජනමාධ්‍යයන්ගේ බලපෑම බලවත්ව ඇති සමාජයක සංස්කෘතියට යි.
(5) රූපවාහිනී මාධ්‍ය මවන සංස්කෘතිය යි.

(41) මාධ්‍ය සංස්කෘතිය හා සමාජයීය වෙනස්වීම් පිළිබඳ සාවද්‍ය ප්‍රකාශයක් වන්නේ,

(1) මාධ්‍ය සංස්කෘතිය නිසා සමාජය කෘත්‍රිම හා හදිසි ලෙස වෙනස් වේ.
(2) සමාජයේ ඉතා සංවේදී චර්යාවන් කෙරෙහි බලපෑම් ඇති කිරීමට මාධ්‍ය සංස්කෘතියට නොහැකියි.
(3) සම්ප්‍රදායයන් බලවත්ව පවතින සමාජවල මාධ්‍ය සංස්කෘතිය මගින් ඇති කළ හැකි වෙනස අවම ය.
(4) මාධ්‍ය සංස්කෘතිය නිසා ඇතිවන සමාජයීය වෙනස්වීම් තුළ සංස්කෘතික ගැටුමක් ඇතිවිය හැකිය.
(5) මාධ්‍ය තුළින් ජනතාවට සිදු කරන අහිසි බලපෑම වැළැක්වීමේ ක්‍රමවේදය කි.

(42) විවිධ සංස්කෘතීන් අතර අවබෝධය වැඩි කිරීම සඳහා වඩාත් හැකියාවක් ඇති මාධ්‍යය වන්නේ,

(1) රූපවාහිනී මාධ්‍යය යි. (2) පුවත්පත් මාධ්‍යය යි.
(3) ගුවන් විදුලි මාධ්‍යය යි. (4) අන්තර්ජාලය යි.
(5) දුරකථන සන්නිවේදන ජාලය යි.

(43) මාධ්‍ය සංස්කෘතික සංසරණයේ අසමතුලිතතාවට බලපාන සාධකයක් කිහිපයක් පහත දැක්වේ.
ඉහත ඒවා අතුරින් නිවැරදි වන්නේ,

A- වෙළඳපොළ ප්‍රවණතා හා මාධ්‍ය හිමිකාරිත්වය
B- මාධ්‍ය සාක්ෂරතාවය හා ග්‍රාහක වට්ටම්
C- මාධ්‍ය යටිතල පහසුකම්
D- දේශපාලන හැසිරීම්

ඉහත ඒවා අතුරින් නිවැරදි වන්නේ,

(1) A, B, D (2) B, C, D (3) A, B,C (4) A, C, D (5) A, B, C, D

(44) සංස්කෘතික ගෝලීයකරණය තුළින් සිදුවන්නේ,

(1) බලවත් ජාතීන්ගේ සංස්කෘතිය දුබල ජාතීන් වෙත බලහත්කාරයෙන් පැටවීම යි.
(2) ලෝකයටම පොදු නව සංස්කෘතියක් බිහිවීම යි.
(3) සියලු රටවල සංස්කෘතීන් ලොව පුරා ව්‍යාප්ත වීම යි.
(4) සියලු රටවල සංස්කෘතික නිෂ්පාදන වෙත ගෝලීය මට්ටමේ පිළිගැනීමක් ඇතිවීම යි.
(5) විවිධ රටවල උසස් සංස්කෘතිකාංග ගෝලීය වපසරිය තුළ ව්‍යාප්ත වීම යි.

(45) මාධ්‍ය සංස්කෘතිය හා ව්‍යාපාරික ආධිපත්‍යය අතර සම්බන්ධය ගැන කියැවෙන පහත ප්‍රකාශවලින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) මාධ්‍ය මෙහෙයවන්නේ ව්‍යාපාරික ආධිපත්‍යය විසිනි.

(2) ව්‍යාපාරිකයින්ගේ අනුග්‍රහයෙන් තොරව මාධ්‍යයට පැවැත්මක් නැත.

(3) සමාජයීය මනස ව්‍යාපාරික ආධිපත්‍යයට ගැළපෙන ලෙස සකස් කිරීම සිදුකරන්නේ මාධ්‍යය විසිනි.

(4) මාධ්‍ය සංස්කෘතියේ ස්වරූපය අනුව එහි ව්‍යාපාරික ආධිපත්‍යය වසන් වී තිබේ.

(5) මාධ්‍ය සංස්කෘතිය තමන්ට අවශ්‍ය පරිදි හැඩගස්වා ගැනීම සඳහා පර්යේෂණ කරනු ලබන්නේ ව්‍යාපාරික විශේෂඥයෝ විසිනි.

(46) මාධ්‍ය සංස්කෘතිය හා වෙළඳපළ ව්‍යාප්තිය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A- මාධ්‍ය සංස්කෘතියට ගොදුරු වන්නන් තමන් වෙළඳ පොළ ව්‍යාප්ත කාර්යයක් ඉටුකරන බව නොදනී.

B- මාධ්‍ය සංස්කෘතියට එරෙහිව බලවත් සාම්ප්‍රදායික මතවාදයක් සමාජය තුළ පවතී.

C- මාධ්‍ය සංස්කෘතිය තුළදී සාම්ප්‍රදායික සංස්කෘතික මතවාදය සැමවිටම බැහැර කෙරේ.

D- ඇතැම් ආගමික චින්තාවන් මාධ්‍ය සංස්කෘතිය හා වෙළඳපොළ ව්‍යාප්තියට එරෙහි වේ.

ඉහත ප්‍රකාශ අතුරින්,

(1) A හා C සත්‍ය වේ. (2) B හා C සත්‍ය වේ.

(3) A හා D සත්‍ය වේ. (4) A, B, C සත්‍ය වේ.

(5) B, C, D සියල්ලම සත්‍ය වේ.

(47) මාධ්‍ය දැන්වීම්කරණය සමාජයට අවශ්‍ය වන්නේ,

(1) ව්‍යාපාරික අදහස් ඉදිරිපත් කිරීම ය.

(2) මහජන සේවාවන් පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීම ය.

(3) මහජන මතවාදය වෙනස් කිරීමට දේශපාලන වශයෙනි.

(4) යම් යම් භාණ්ඩ හා සේවාවන් විශ්වාසයෙන් යුතුව තෝරා බේරා ගැනීම ය.

(5) ඉහත සියල්ලම සඳහා ය.

(48) අලෙවි ප්‍රවර්ධනය සඳහා පුද්ගල ප්‍රතිරූප ඉස්මතු කිරීම හා යොදා ගැනීම බහුලව සිදුවන්නේ,

(1) ජනප්‍රිය සංස්කෘතිය තුළ ය. (2) වෙළඳ සංස්කෘතිය තුළ ය.

(3) බහුජන සංස්කෘතිය තුළ ය. (4) ජන සංස්කෘතිය තුළ ය.

(5) සාම්ප්‍රදායික සංස්කෘතිය තුළ ය.

(49) ගෝලීය සංස්කෘතියක් නිර්මාණය කිරීමට සන්නිවේදන මාධ්‍ය හා එක්ව කටයුතු කරන්නේ,

(1) බහු ජාතික සමාගම් ය. (2) ජනමාධ්‍ය ආයතන ය.

(3) අධිරාජ්‍යවාදී රාජ්‍යයන් ය. (4) දැන්වීම් ආයතන ය.

(5) රාජ්‍ය නොවන සංවිධාන ය.

(50) "ගණිකා නිවාසයක් වැටලීමේ දී දෙමළ තරුණියක් අත්අඩංගුවට" ඉහත ප්‍රවෘත්ති ශීර්ෂ පාඨය සංශෝධනය කළ යුතු බව ප්‍රවෘත්ති සංස්කාරක වරයා දන්වා සිටියේය. ඒ අනුව ඔහු එහි දුටු වරද නම්,

(1) ගණිකා නිවාසයක් පිළිබඳ පුවතක් පළ කිරීම දෙවරක් සිතා බැලිය යුතු බව ය.

(2) තරුණියගේ වාර්ගික අනන්‍යතාව ඉස්මතු කිරීම අනුචිත බව ය.

(3) එම පුවත පළ කිරීම කාන්තාවන්ගේ ජීවිත හැල්ලු වීමට හේතුවක් වන බව ය.

(4) එම පුවත පළ කිරීමෙන් සදාචාර විරෝධී ක්‍රියාවන්ට ප්‍රචාරයක් ලැබීමට ය.

(5) මෙම පුවත දැක සිංහල අන්තවාදීන් කුපිත වීමට ඉඩ ඇති බව ය.

***

**ඩී.එස්. සේනානායක විද්‍යාලය, කොළඹ 07.**

**D.S. Senanayake College, Colombo 07.**

තුන්වන වාර ඇගයීම -2016

Third Term Test - 2016

12 ශ්‍රේණිය -

# Grade 12

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II පත්‍රය

## Mass Communition & Media Studies - Paper II

පැය තුනයි.

Three hours

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(01) (1) කිසියම් සංදේශයක් අර්ථකථනය කර ගැනීමත්, පසුව ඊට ප්‍රතිපෝෂණය ලබා දීමත් යන ක්‍රියාවලින් ඉතා සරලව ඉදිරිපත් කෙරෙන සන්නිවේදන ආකෘතිය ඉදිරිපත් කළේ කවුරුන් විසින් ද? (ලකුණු 2)

(2) එම ආකෘතිය ඇඳ කොටස් නම් කර, එහි දැකිය හැකි දුර්වලතාවයක් නම් කරන්න. (ලකුණු 4)

(3) සන්නිවේදන ක්‍රියාවලියක් විවිධ හේතු සාධක මත බිඳ වැටිය හැකිය. එවැනි සාධක දෙකක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 6)

(4) සමූහ සන්නිවේදනය, ජන සන්නිවේදනයෙන් වෙනස් වන ආකාර හතරක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 8)

(02) (1) අවාචික සන්නිවේදන අංග හතරක් නම් කරන්න. (ලකුණු 2)

(2) සන්නිවේදන අරමුණු හතරක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 4)

(3) පුද්ගලාන්තර සන්නිවේදනයේ ප්‍රබලතා තුනක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 6)

(4) ප්‍රතිපෝෂණ ක්‍රියාවලියක් නිසා සන්නිවේදකයාට හා ග්‍රාහකයාට අත්වන වාසි හතරක් නම් කර, ඉන් දෙකක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 8)

(03) (1) උප භාෂාවක ලක්‍ෂණ හතරක් නම් කරන්න. (ලකුණු 2)

(2) නව මාධ්‍ය තුළ භාෂා භාවිතයේ සුවිශේෂතා දෙකක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 4)

(3) ගුවන් විදුලි මාධ්‍යය තුළ භාෂා භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු තුනක් විස්තර කරන්න. (ලකුණු 6)

(4) විකල්ප මාධ්‍ය ලක්‍ෂණ දෙකක් හා පුරවැසි මාධ්‍ය ලක්‍ෂණ දෙකක් නම් කර ඉන් එක බැගින් විස්තර කරන්න. (ලකුණු 8)

(04) (1) අව්ධිමත් සන්නිවේදනයේ ලක්‍ෂණ හතරක් නම් කරන්න. (ලකුණු 2)

(2) ඵලදායී කථනයක යෙදීමේ දී කථකයා විසින් සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 4)

(3) සමූහ සන්නිවේදන අවස්ථාවකදී සන්නිවේදකයාට හා ග්‍රාහකයාට ආචාරශීලී විය හැකි ආකාර තුන බැගින් දක්වන්න. (ලකුණු 6)

(4) ගෝලීයකරණය, ශ්‍රීලාංකික සමාජය වෙත එල්ල කර ඇති බලපෑම් හතරක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 8)

(05) (1) මහජන සම්බන්ධතා කාර්යයේ දී මහජනයා යනුවෙන් හැඳින්වෙන්නේ කිනම් පිරිසක් ද? (ලකුණු 2)

(2) ආයතනයක මහජන සම්බන්ධතාව ගොඩ නැංවීම සඳහා යොදාගත හැකි මෙවලම් දෙකක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 4)

(3) ආයතනයක අභ්‍යන්තර මහජනයා හා බාහිර මහජනයා යනුවෙන් හැඳින්වෙන්නේ කුමන පිරිසක් දැයි නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 6)

(4) මහජන සම්බන්ධතාව ඩිජිටල්කරණයෙන් වෙනස්වන ආකාරය දක්වා, ඩිජිටල්කරණයෙන් සමාජයට සිදුවන අහිතකර බලපෑම් තුනක් විස්තර කරන්න. (ලකුණු 8)

(06) (1) මහජන සම්බන්ධතා සැලසුමක් සකස් කිරීමේ දී අනුගමනය කළ යුතු පියවර පහක් නම් කරන්න. (ලකුණු 2)

(2) මාධ්‍ය නිවේදනයක් සකස් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් විස්තර කරන්න. (ලකුණු 4)

(3) මාධ්‍ය සාකච්ඡාවක් මෙහෙයවීමට සූදානම් වන නිවේදකයෙකු අවධානය යොමු කළ යුතු කරුණු තුනක් විස්තර කරන්න. (ලකුණු 6)

(4) ආයතනයක අභ්‍යන්තර මහජන සම්බන්ධතාව ශක්තිමත් කිරීමට යොදාගත හැකි උපක්‍රම හතරක් නම් කර ඉන් තුනක් විස්තර කරන්න. (ලකුණු 8)

(07) (1) සංස්කෘතික මූලිකාංග හතරක් නම් කරන්න. (ලකුණු 2)

(2) මාධ්‍ය හා සංස්කෘතිය අතර සම්බන්ධතාව කරුණු දෙකක් ඔස්සේ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 4)

(3) මාධ්‍ය සංස්කෘතියේ ලක්ෂණ තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 6)

(4) මාධ්‍ය සංස්කෘතිය සමාජය මත බලපෑම් ඇති කරන ආකාර හතරක් නම් ඉන් දෙකක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 7)

***